# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
# உள்நாட்டு இறைவரித் திணைக்களம்
# DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 20135411

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


චක්‍රලේඛ අංක: SEC/2018/01

දිනය : 22.03.2018

බැංකු / මූල්‍යායතන සඳහා චක්‍රලේඛය

## බැංකු හෝ වෙනත් මූල්‍යායතන මගින් ගෙවනු ලබන පොළී සඳහා රඳවාගැනීමේ බදු

2017 වර්ෂයේ අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වගන්තියෙහි සඳහන් විධිවිධානයන්ට අදාල පහසුකම් සැලසීම සඳහා 2018 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි යම් බැංකුවක හෝ මූල්‍යායතනයක තැන්පත් කරනු ලබන තැන්පතු මත ගෙවනු ලබන පොළිය, වට්ටම් හෝ 32 වන වගන්තිය මගින් දක්වා ඇති ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු වලින් ලැබෙන ආදායමෙන් ගෙවිය යුතු මුදලින් ආදායම් බදු අඩුකිරීම සඳහා සවිස්තර සටහන් සහ උපදෙස් මෙම චක්‍රලේඛය මගින් ලබාදෙන අතර යම් තැනැත්තකුට ශ්‍රී ලංකා රුපියල් හෝ වෙනත් යම් විදේශීය මුදලකින් තැන්පත් කර ඇති මුදල් මත ගෙවිය යුතු පොළිය හෝ වට්ටම් මත ආදායම් බදු අඩු කිරීම සඳහා සෑම බැංකුවකටම හා මූල්‍ය ආයතනයකටම මෙය අදාල වේ.(තැනැත්තා යන්නෙන් පුද්ගලයෙකු, හවුල් ව්‍යාපාරයක්, සමාගමක්, පුද්ගල මණ්ඩලයක් සහ පුණ්‍යායතනයක් යනාදිය ඊට ඇතුළත් වේ.)

### 1. අඩුකිරීමේ කාලය

තැන්පත්කරු සඳහා හෝ ඔහු වෙනුවෙන් බැංකුවක හෝ මූල්‍යායතනයක පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට පොළිය / වට්ටම ලෙස ගෙවන ලද හෝ බැර කරන ලද ප්‍රතිලාභ, ප්‍රතිආයෝජනය, තැන්පතුවට එකතු කරන හෝ ප්‍රාග්ධනිත කරන අවස්ථාවේදී බදු රඳවාගත යුතු අතර, විදේශීය ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන ගිණුම් සම්බන්ධයෙන්, පොළිය උපචිත වන අවස්ථාවේ දී ආදායම් බදු රඳවා ගත යුතුවේ. විදේශීය ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන ගිණුම් සම්බන්ධයෙන් විනිමය අනුපාතය, ආදායම් බද්දට යටත් වන දිනයට අදාල විනිමය අනුපාතය විය යුතුවේ.

### 2. රඳවා ගැනීමේ බදු අඩු නොකරන අවස්ථාවන්

(I) පනතේ 84 වන වගන්තිය යටතේ වන විධිවිධාන ප්‍රකාරව බදු අඩු කිරීමේ අවශ්‍යතාවය පහත දැක්වෙන පොළී /වට්ටම් සඳහා අදාල නොවේ.

අ) මූල්‍ය ආයතනයක් විසින් සපයන ලද සාමාන්‍ය ණය සහ අත්තිකාරම් මත ඒ මූල්‍ය ආයතනයට

ගෙවන ලද පොළිය;

ආ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර මත හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ නිකුත් කරන ලද යම් භාණ්ඩාගාර බිල්පත් මත යම් තැනැත්තකුට ගෙවූ පොළියක් හෝ වට්ටමක්; හෝ

ඇ) ශ්‍රී ලංකා රජය මගින් හෝ වෙනුවෙන් 2008 ඔක්තෝබර් 21 දින හෝ ඊට පසුව නිකුත් කරන ලද, විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කළ රාජ්‍ය බැඳුම්කරයක නිකුත් කරන්නා විසින්, යම් වාසික නොවූ තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට, අවස්ථාවෝචිත පරිදි, ගෙවන ලද හෝ ඉඩ දෙන ලද පොළිය / වට්ටමට සමාන මුදල් ප්‍රමාණයක්;

ඇ) එක් එක් තක්සේරු වර්ෂයක් සඳහා රු. මිලියන 1.5 ක, මූල්‍ය ආයතන වලින් ව්‍යුත්පන්න වන පොළී ආදායමක් සහිත ජ්‍යෙෂ්ඨ පුරවැසියකුගේ (වයස අවුරුදු 60 හෝ ඊට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියකු සම්බන්ධයෙන් වන විට දී) මුළු ආදායම් පොළිය (සියළුම තැන්පතු වලින්) දක්වාම (ඇමුණුම 1 හි සඳහන් වන ආකෘතිය අනුව ජ්‍යෙෂ්ඨ පුරවැසියකුගේ ප්‍රකාශනයක් මත);

ඉ) පුණ්‍ය ආයතනයකින් ලැබෙන පොළිය සම්පූර්ණයෙන්ම එම පුණ්‍ය ආයතනය මගින් නඩත්තු කරනු ලබන නිවාසයක සිටින ළමයින්ට, වැඩිහිටියන්ට හෝ ආබාධිතයින්ට රැකවරණය සැලසීමේ අරමුණින් යොමුකරන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අයුරින් සනාථ වන අවස්ථාවක දී, එම පුණ්‍ය ආයතනය විසින් උපයනු ලබන පොළිය;

(මෙම නිදහස් කිරීම සඳහා එම ආයතනය සුදුසුකම් ලබා ඇති බවට අදාළ මූල්‍යායතනය විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තහවුරු කිරීමක් ලබාගත යුතුය)

(II) පහත සඳහන් තැනැත්තන් මත උපචිත වන පොළිය මත රඳවා ගැනීමේ බදු අදාළ නොවේ.

(අ) යම් රජයේ දෙපාර්තමේන්තුවක් ඇතුළු ශ්‍රී ලංකා රජය හෝ පළාත් පාලන ආයතනයක් මගින්;

(ආ) මූල්‍ය මණ්ඩලය ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුව මගින්;

(ඇ) විශ්ව විද්‍යාල පනත යටතේ ස්ථාපනය කර ඇති ඕනෑම විශ්ව විද්‍යාලයක්;

(ඈ) රජයේ අනුග්‍රහය මත සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ලියාපදිංචි වී ඇති රජය විසින් සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුගමනය කිරීමට බැඳී සිටින්නාවූද පෞද්ගලික පාසලක් ;

(ඉ) 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කර ඇති සමූපකාර සමිති

(ඊ) තානාපති විනිර්මුක්ති නීතියක් යටතට ගැනෙන විදේශ රජයක්;

(උ) තානාපති විනිර්මුක්ති නීතියක් යටතට ගැනෙන ඕනෑම ජාත්‍යන්තර සංවිධානයක් හෝ ශ්‍රී ලංකා රජය සමග එළඹී ඇති ගිවිසුමකට යටත්ව ජාත්‍යන්තර සංවිධානයකට පිරිනමා ඇති නිදහස් කිරීමක්;

(ඌ) කිසියම් පුද්ගලයකුට පිරිනැමී ඇති වරප්‍රසාද අනුව, එනම්

i. තානාපති විනිර්මුක්ති නීතිය හෝ ඒ සමාන නීතියක් මගින්;

ii. වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ආයතනයක්;

## 3. බදු අඩුකිරීමේ අනුප්‍රමාණයන්

පොළී ගෙවන හෝ මුල් ගෙවීමට වඩා " අතිරික්තය" වශයෙන් සඳහන් කර ඇති යම් මුදලක් සඳහා (යම් තැන්පතු සහතිකයක් සම්බන්ධයෙන් වන විට) ඉඩ ලබාදෙන සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් ද ඉස්ලාමීය මූල්‍ය කටයුතුවලදී ද පහත සඳහන් පරිදි එම වට්ටමෙන් හෝ ප්‍රතිලාභයකින් (බදු නිදහස් කර නැත්නම්) බදු රඳවාගත යුතුය;

(i) පොළිය / වට්ටම හෝ ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු වලින් ආදායමක් ලෙස ඕනෑම තැනැත්තෙකුට ගෙවනු ලැබූ (ජ්‍යෙෂ්ඨ පුරවැසියකු වන පුද්ගලයකු නොවන විට) හෝ වෙනත් ගිණුමකට බැර කරනු ලැබූ ගෙවීමක් සම්බන්ධයෙන් අදාල රඳවාගැනීමේ බදු අනු ප්‍රමාණය 5% කි;

(ii) ජ්‍යෙෂ්ඨ පුරවැසියකු සම්බන්ධයෙන් ව්‍යුත්පන්න වන පොළී ආදායම එක් එක් තක්සේරු වර්ෂයක් සඳහාම රු. 1,500,000 කට වඩා ඉක්මවන්නේ නම්, එම පොළී ආදායමේ අතිරික්තය සම්බන්ධයෙන් රඳවාගැනීමේ බදු සඳහා ඇති වගකීමට අදාල අනුප්‍රමාණය 5% කි.

සටහන් :

(අ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් හෝ කොමසාරිස් ජනරාල් විසින් බලය පවරන ලද යම් නිලධාරියකු ( 5 වන පරිච්ඡේදයේ සඳහන් පරිදි) යම් නියෝගයක් නිකුත් කර ඇත්නම්, එම නියෝගයට අනුව එම අඩු කිරීම කළ යුතු අතර එම නියෝගය සුරක්ෂිතව තබා ගත යුතු අතර එය පරීක්ෂා කිරීම (අවශ්‍ය නම්) සඳහා කොමසාරිස් ජනරාල් විසින් බලය ලබාදී ඇති යම් නිලධාරියකුට ලබාගත හැකි විය යුතුය;

(ආ) දේශීය ආදායම් පනතේ 195 වන වගන්තිය පරිදි (අර්ථ නිරූපනය), තැනැත්තා යනුවෙන් පුද්ගලයෙක් හෝ අස්ථිත්වයක් අදහස් වන අතර සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක්, පොල්මඃකරුවෙක්, රාජ්‍ය නොවන සංවිධානයක් හා පුණ්‍යායතනයක් ඊට ඇතුළත් වේ. තවද අස්ථිත්වය යන්නෙන්, යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ භාරයක් අදහස් වන නමුත් යම් පුද්ගලයකු ඇතුළත් නොවේ.

## 4. බද්ධ ගිණුම්

තනි පුද්ගලයින්ගේ බද්ධ ගිණුමේ පොළිය බැංකු හෝ මූල්‍යායතන වෙත ඉදිරිපත් කරන ලද විධානයට අනුකූලව එම තනි පුද්ගලයින් අතරේ විභජනය කරනු ලැබිය හැකි අතර, එලෙස එක් එක් පුද්ගලයා වෙත විභාජනය කරන ලද එම පොළී කොටස, එම තනි පුද්ගලයාට ගෙවිය යුතු පොළිය සේ සලකනු ලැබිය හැකිය.

## 5. පුණ්‍ය ආයතන සඳහා විධාන

පොළිය ලබන්නාට යම් තක්සේරු වර්ෂයන් සඳහා එම ලබන්නා මගින් ගෙවිය යුතු / ගණනය කරන ලද ආදායම් බදු මුදල පනතේ 9 වන වගන්තිය යටතේ බදු වලින් නිදහස් වන බවට විශ්වාස කළ හැකි හේතු තිබේ නම් එම තක්සේරු වර්ෂයේ පොළියෙන් බැංකු / මූල්‍යායතන විසින් ආදායම් බදු අඩු නොකළ යුතු බවට එම ලබන්නාට කොමසාරිස් ජනරාල්ගෙන් නියෝගයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ හැකි අතර එම නියෝගය පරිදි වෙනස්කම් සිදුකිරීම සඳහා බැංකු හෝ මූල්‍යායතනයට නියෝග කළ හැක.

කොමසාරිස් ජනරාල් හෝ බලය පවරන ලද නිලධාරියකු විසින් නිකුත් කරන ලද එම නියෝගයට බැංකු/මූල්‍යායතන ගරු කළ යුතු අතර ඒ අනුව වෙනස්කම් සිදුකළ යුතුය.

## 6. බදු අඩුකිරීමේ සහතිකය

පහත ආකෘතියට අනුව සෑම තැන්පත්කරුවකුටම (තනි පුද්ගල, හවුල් ව්‍යාපාර, සමාගම්, පුද්ගල මණ්ඩලයක්, භාරයක් හෝ පුණ්‍ය ආයතනයක් ) බදු අඩුකිරීමේ සහතිකයක්, එක් එක් අඩුකිරීමට අදාලව 3 වන පරිච්ඡේදයට අනුව ආදායම් බදු අඩුකරනු ලබන සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් මගින් නිකුත් කිරීම අවශ්‍ය වේ. රඳවාගැනීමේ සහතිකය ලිත් මාසයක් ආවරණය විය යුතු අතර මාසය අවසානයේ සිට දින 30 ක් ඇතුළත භාරදිය යුතුය.

සටහන: පුණ්‍යායතනයකින් හෝ නේවාසික තනි පුද්ගලයකුගේ යම් තැන්පතුවක් මත පොළියෙන් නිසි ආකාරයෙන් කරන ලද රඳවාගැනීමේ බදු අඩුකිරීමක් වේ නම්, එම පොළිය අවසාන රඳවාගැනීමේ බද්දට යටත් වේ.

## 7. බැංකුව / මූල්‍යායතනය මගින් පවත්වාගෙන යායුතු වාර්තා හා ඒවායේ අනෙකුත් බැඳීම්

සෑම බැංකුවක් හා මූල්‍යායතනයක් විසින් -

(අ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ නියමයන් යටතේ රඳවාගැනීමේ අනුයෝජිතයෙක් ලෙස ලියාපදිංචි වීම අවශ්‍ය වේ.
195 වන වගන්තිය අනුව;
" රඳවාගැනීමේ අනුයෝජිතයා " යන්නෙන් මෙම පනත යටතේ යම් ගෙවීමකින් බදු රඳවා ගැනීමට නියම කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වේ.
" රඳවා ගනු ලැබීමට යටත් වන්නා " යන්නෙන් මේ පනත යටතේ, යම් ගෙවීමකින් බද්දක් රඳවා තබා ගැනීමට නියම කරනු ලැබේද එකී ගෙවීම ලබන්නා වූ හෝ හෝ ලැබීමට හිමිකම ඇති තැනැත්තා අදහස් වේ.

(ආ) දේශීය ආදායම් පනතේ 102 වන වගන්තියට අනුව දැනටමත් ලියාපදිංචි නොවූ, එහෙත් තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් සැපයීමේ වගකීම පැවරෙන සෑම බැංකුවක් සහ මූල්‍ය ආයතනයක්ම (අනුනියෝජිතයා) බදු අඩුකිරීමට දින 30කට නොවැඩි කාලයක් තුළ කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි විය යුතුය.

(ඇ) දේශීය අදායම් පනතේ 86 වන වග්නිතය අනුව එක් එක් තක්සේරු වර්ෂය අවසානයේ දින 30 ක් ඇතුළත සෑම රඳවාගැනීමේ අනුනියෝජිතවරයෙකුම කොමසාරිස් ජනරාල් වෙත වාර්තාවක් ගොනු කළ යුතුය.
යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් ගෙවනු ලබන පොළිය / අතිරික්ත ප්‍රමාණයේ නිසි වාර්තා තබා ගත යුතු අතර යම් තැනැත්තකුට යම් තක්සේරු වර්ෂයක දිනකදී හෝ දිනයන්හිදී

ගෙවනු ලබන එම පොළිය හෝ අතිරික්තය ඇමුණුම 3 හි සඳහන් ආකාරයට ඉදිරිපත් කළ යුතුය.

(ඇ) 2 වන පරිච්ඡේදයේ සඳහන් වන පරිදි රඳවාගැනීමේ බද්දෙන් නිදහස් වන පොළී සම්බන්ධයෙන් ඇමුණුම 4 හි සඳහන් වන පරිදි නිසි වාර්තා තබා ගත යුතු වේ.

සටහන: කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලැබූ (ලිඛිතව) නිලධාරියකු විසින් ඉහත සඳහන් කරනු ලබන වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකිය.

## 8. රඳවාගනු ලැබූ හෝ රඳවාගනු ලැබූ ලෙස සළකනු ලබන බදු ගෙවීම

i. 3 වන පරිච්ඡේදය ප්‍රකාරව රඳවාගනු ලැබූ බදු මුදල් සෑම රඳවාගැනීමේ අනුනියෝජිතයකු විසින්ම එක් එක් ලිත් මාසයක් අවසන් වීමෙන් පසු දින 15 ක් තුළ, එම මාසය තුළදී රඳවාගන්නා ලද යම් බදු මුදලක් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු අතර අදාල බද්දේ මාසික ගෙවීම, දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ගෙවීමේ ලදුපත (DLN අංකයක් සහිත) මගින් මහජන බැංකුවේ ගිණුම් අංක 014-1002-6-9026620 ට බැර කළ යුතුය

ii. රඳවාගැනීමේ අනුයෝජිතයකු දේශීය ආදායම් පනතේ VIII වන පරිච්ඡේදයේ 11 වන කාණ්ඩය ප්‍රකාරව රඳවාගැනීමේ බද්ද රඳවාගැනීමට අපොහොසත් වූ විට, එම රඳවාගැනීමේ බද්ද රඳවාගත් ලෙස සළකා අදාල කාලපරිච්ඡේදය තුළදීම ගෙවීම සිදු කළ යුතු වේ.

## 9. වාර්තා හා උපලේඛන ඉදිරිපත් කිරීම

**i. වාර්තා**

සෑම රඳවාගැනීමේ අනුයෝජිතයෙකුම 2018 අප්‍රේල් 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නියමිත ආකෘතියකට අනුව වාර්ෂික වාර්තාව මාර්තු 31 දිනෙන් අවසන් වන එක් එක් වර්ෂය අවසානයෙන් පසුව දින 30 ක් තුළ කොමසාරිස් ජනරාල්වරයා වෙත ගොනුකළ යුතුය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වාර්තාවල ඡායා පිටපත් භාරනොගන්නා බව කාරුණිකව සළකන්න. එසේම, කිසිදු බද්දක් ගෙවීමට නොමැති අවස්ථාවන්හිදීද, වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

**ii. උපලේඛන**

2018 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, දේශීය ආදායම් පනතේ 84 වන වගන්තියේ සඳහන් පරිදි යම් අයකිරීමක් හෝ අවසර දෙන ලද වට්ටමක් හෝ බැරකරන ලද හෝ ගෙවන ලද පොළී සඳහා අඩුකරන ලද රඳවාගැනීමේ බදු අදාල වේ නම් ඇමුණුම 3 සහ ඇමුණුම 4 හි සඳහන් වන ආකෘතියට අනුව උපලේඛන වල ඉදිරිපත් කළ යුතුවේ.

සටහන: මෙම උපලේඛන විද්‍යුත් පෝරම ( Excel csv ආකෘතියෙහි) මගින් සැපයීම අවශ්‍යය. කෙසේවුවද, බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 20ට වඩා අඩුවේනම් දෘඩ පිටපත් එවිය හැක.

ඩී.එම්.එල් අයි. දිසානායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

අයිවන් දිසානායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02

ඇමුණුම 2

සහතික අංකය/අනුක්‍රමික අංකය:

රඳවාගැනීමේ අනුයෝජිත /
බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය:

## බදු අඩුකිරීමේ සහතිකය

බැංකුවේ / මූල්‍යායතනයේ නම හා ලිපිනය :..................................................................
තැන්පත්කරුගේ නම හා ලිපිනය :...........................................................................
ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය / බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය...........................................................................................................
කාලය : .......................................... සිට ...........................................................දක්වා

(අ) දළ පොළී ප්‍රමාණය (රු) ...............................................................

(ආ) (i) බදු අනුප්‍රමාණය :...........................................................................
(ii) අඩුකරන ලද බදු මුදල (රු) :…...........................................................

(ඇ) බදු අඩුකරන ලද දිනය : ..........................................................................

.............................................................
බලයලත් නිලධාරියාගේ නම

.............................................................
බලයලත් නිලධාරියාගේ අත්සන

දිනය : ............................................

**ඇමුණුම 1**

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

....................................................

....................................................

....................................................

.................................................... වෙතටයි.
(මූල්‍යායතනයේ නම හා ලිපිනය)

**ගිණුම් අංකය:....................................................**

**තක්සේරු වර්ෂය:..............................................**

## ප්‍රකාශනය (ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් කරනු ලබන)

....................................................................................................................................(සම්පූර්ණ නම)

වන මම ....................................................................................................................(ලිපිනය) හි පදිංචි මෙයින් ප්‍රකාශ කර සිටිමි;

මම ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකු සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්මි. ( 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව)

1. ඉහත තක්සේරු වර්ෂය සඳහා මෙම ගිණුමේ හෝ මෙම බැංකුවේ වෙන යම් ගිණුමක හෝ යම් වෙනත් මූල්‍යායතනයක තැන්පත් කර ඇති මුදල් සඳහා මා විසින් ලබන පොළී එකතුව රු. 1,500,000/= නොඉක්මවන්නේය. එබැවින්, මෙම ගිණුමට ගෙවිය යුතු පොළියෙන් රඳවාගැනීමේ බදු අඩුකිරීමෙන් වළකින මෙන් කාරුණිකව ඉල්ලමි.

2. මෙම බැංකුවේ යම් වෙනත් ගිණුමකින් සහ යම් වෙනත් මූල්‍ය ආයතනකින් ගිණුම්වලින් ලැබිය යුතු පොළියේ එකතුව සහ ඉහත සඳහන් ගිණුමෙන් මා විසින් ලබාගන්නා පොළී ආදායමේ එකතුව ඉහත තක්සේරු වර්ෂය සඳහා රු. 1,500,000/= ක මුළු පොළියක් ඉක්මවිය හැක. එබැවින්, කරුණාකර පොළිය රු. ................................ ක් මත රඳවාගැනීමේ බදු අඩු කරන්න.

   ( බදු සහනයේ ශේෂය = රු. 1,500,000 - ඉහත සඳහන තක්සේරු වර්ෂය සඳහා මෙම ගිණුම හැර අනිත් සියළුම ගිණුම් වලින් නියමිත දිනට පොලිය)

3. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ඇති රු. 1,500,000/= ක පොළී ආදායම් බදු සහනය මෙම බැංකුවේ වෙනත් යම් ගිණුම්වල හෝ වෙනත් මූල්‍යායතන තැන්පතු මුදල් මත මා විසින් ලබාගන්නා පොළී ආදායම මත මා විසින් ලබාගෙන ඇත. එබැවින්, මෙම ගිණුමෙන් මා ලබාගන්නා මුළු පොළිය සඳහා කරුණාකර රඳවාගැනීමේ බදු අඩුකරන්න.

ජාතික හැඳුනුම්පත් අංකය: ...............................................................

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය: .................................................................

ඉහතින් සඳහන් කළ ප්‍රකාශය සත්‍ය හා නිවැරදි බවට මම සහතික වෙමි.

**මා පදිංචි ස්ථානයේ යම් වෙනසක් වුවහොත් ඒ අවස්ථාවේදී ඒ බව බැංකුව වෙත දන්වා සිටිමි.**

........................................ ..........................................

දිනය ප්‍රකාශකගේ අත්සන

(* කරුණාකර අදාල නොවන වාක්‍ය කපාදමන්න)

ඇමුණුම 3

## උපලේඛන 1- පොළියෙන් රඳවා ගැනීමේ බදු

යම් තැනැත්තකුගෙන් අඩුකරනු ලබන රඳවාගැනීමේ බදු පහත උපලේඛනයේ ප්‍රකාශ කළ යුතුය.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | වර්ගය | නම | ලිපිනය | බදු ගෙවන්නාගේ අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය/ ජාතික හැඳුනුම්පත් අංකය | ගිණුම් අංකය/ සහතික අංකය | තැන්පතුව /ආයෝජනය ආරම්භ වන දිනය (වර්ෂය/ මාසය/දිනය) | කල් පිරෙන දිනය (වර්ෂය/ මාසය/ දිනය) | ගිණුමේ අගය/ ආයෝජනයේ අගය (රු) | පොළී අනුපාතය (%) | ගෙවන ලද / ගෙවිය යුතු පොළිය (රු) | රඳවා ගැනීමේ බදු අනුපාතය (%) | රඳවා ගැනීමේ බද්ද (රු) | රඳවා ගැනීමේ බදු සහතික අංකය |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

ඇමුණුම 4

## උපලේඛන 2 - රඳවාගැනීමේ බදු නිදහස් කිරීමේ විස්තර

2 වන පරිච්ඡේදය යටතේ දක්වා ඇති රඳවාගැනීමේ බදු අඩු කිරීම් අදාල නොවන විට හෝ බදු නිදහස් කිරීම්, පහත උපලේඛනයේ ප්‍රකාශ කල යුතුය

| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) |
|---|---|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | වර්ගය | ශාඛා කේතය | පොළිය ලබන්නාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය / බදු ගෙවන්නාගේ අංකය | ගෙවන ලද පොළී ප්‍රමාණය | නිදහස් කිරීමට හේතුව |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

| වර්ගය සඳහා උදාහරණ | බදු නිදහස් කිරීමේ හේතු සඳහා උදාහරණ |
|---|---|
| ස්ථාවර තැන්පත් | සාමාන්‍ය ණය |
| ඉතිරිකිරීමේ ගිණුම් | ජ්‍යෙෂ්ඨ පුරවැසි |
| විදේශ මුදල් ගිණුම් | පුණ්‍යායතන |
| තැන්පත් සහතික | භාණ්ඩාගාර බිල්පත් |
| සාමූහික ණය සුරැකුම්පත් | භාණ්ඩාගාර බැඳුම්කර |
| රජයේ සුරැකුම්පත් | ස්වෛරී බැඳුම්කර |
| වෙනත් 1 | වෙනත් |